**දේශගුණයට ඔරොත්තු දෙන ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP) - 2022**

**-----------------------------------------------------------------------------------------------------------**

දේශගුණයට ඔරොත්තු දෙන ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතියේ (CRIWMP) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ හරිත දේශගුණික අරමුදල (GCF) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) අතර 2016 අගෝස්තු 05 දින එළඹී ආධාර ගිවිසුමේ 17.01 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ආධාර ගිවිසුමට අනුව වාරිමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ ආයතන වේ.

ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ දේශගුණික විපර්යාසවලට එරෙහිව ආහාර සුරක්ෂිතතාව, සෞඛ්‍ය සහ යහපැවැත්ම ආරක්ෂා කිරීම සඳහා ජල කළමනාකරණය සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් කුඩා වතු හිමියන්ගේ, විශේෂයෙන් වියළි කලාපයේ කාන්තාවන්ගේ ජීවන සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සහ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා වන GOSL හි දැක්මට සහාය වීමයි.
වියළි කලාපයේ ගංගා ද්‍රෝණි තුනක ග්‍රාමීය වාරිමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සහ දේශගුණයට ඔරොත්තු දෙන ගොවිතැන් ක්‍රම පුළුල් කිරීම අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට ආරක්ෂිත පානීය ජලය සඳහා වසර පුරා ප්‍රවේශය ලබා දීම සඳහා දේශගුණයට ඔරොත්තු දෙන, විමධ්‍යගත ජල සැපයුම සහ කළමනාකරණ විසඳුම් වැඩි දියුණු කිරීම, නියඟ සහ ගංවතුර සහ ව්‍යාපෘති කළමනාකරණය සඳහා කුඩා වතු හිමියන්ගේ ජල කළමනාකරණය සහ අනුවර්තනය වීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා දේශගුණය සහ ජල විද්‍යාත්මක නිරීක්ෂණ සහ පුරෝකථන පද්ධතිය ශක්තිමත් කිරීම යන අංග හතරක් යටතේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර තිබුණි.

ආධාර ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 7,521.45 ට සමාන ඇ. ඩොලර් මිලියන 52.084 ක් වූ අතර එයින් රු. මිලියන 5,499.71 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 38.084 ක් හරිත දේශගුණික අරමුදල (GCF) විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 2021.74 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යකරණය කිරීමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතිය 2017 ජූලි මස එහි කටයුතු ආරම්භ කර 2024 ජූනි මාසය වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

**1.3** මතය වියාචනය

ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන්, මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

**1.4 මතය වියාචනය සඳහා පදනම**

මම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලව මගේ විගණනය සිදු කරන ලදී . මාගේ වගකීම්, එම ප්‍රමිතීන් යටතේ මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වන විගණකගේ වගකීම් අංශයේ තවදුරටත් විස්තර කර ඇත.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

මගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් පවත්වා විගණක වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේ වෙතත්, මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන්, මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයක් සඳහා පදනමක් සැපයීම සඳහා ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 ජූලි සිට 2024 ජුනි දක්වා කාලය සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ හරිත දේශගුණික අරමුදල (GCF) අතර 2017 ජුනි 07 වැනි දින ඇ. එ. ඩො. මිලියන 38.084 කට සමාන රු. මිලියන 5,499.71 ක් ශ්‍රී ලංකා රජයට ලබා දීම සඳහා ක්‍රියාකාරකම් ගිවිසුමක් (ප්‍රදාන) අත්සන් කර තිබුණි. ගිවිසුමට අනුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය (MMDE) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන අතර එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) ප්‍රතීතනය ලත් ආයතනය වේ. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික විපර්යාස හේතුවෙන් කුඩා වතු හිමියන් මුහුණ දෙන ගැටළු අවම කිරීම ව්‍යාපෘතියේ අරමුණ වන අතර 2016 ඔක්තෝබර් 04 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව 2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි MMDE යටතේ ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයක් ස්ථාපිත කරන තිබුණි. අරමුදල් සහිත ක්‍රියාකාරකම් ගිවිසුමේ (FAA) 3 වන වගන්තියට අනුව, අරමුදල් සපයන ක්‍රියාකාරකම් සඳහා මූල්‍යකරණයට සහාය වීම පිණිස ඇ. එ. ඩොලර් මිලියන 38.084 ට සමාන මුදලක්, ප්‍රතීතනය ලත් ආයතනය (UNDP) විසින් ක්‍රියාත්මක කරවීමේ ආයතනය (MMDE) වෙත ප්‍රදානයක් ලෙස ලබා දිය යුතුව තිබුණි. කෙසේ වෙතත්, හරිත දේශගුණික අරමුදල මගින් පසුගිය වසර 06 තුළ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන වෙත ඇ.එ. ජ. ඩොලර් මිලියන 30.01 ට සමාන රු. මිලියන 6,650.66 ක්, මුදලක් ලබා දී ඇති නමුත් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත ලබා දී ඇත්තේ ඇ.ඩො. මිලියන 7.99 කට සමාන රු.මිලියන 1,465.15 ක් පමණක් වන අතර ඉතිරි ඩොලර් මිලියන 13.94 ට සමාන රු. මිලියන 2,776.61 ක් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් | නිරීක්ෂණය පිළිගනු ලැබේ | අරමුදල් සපයන නියෝජිතායතනය විසින් සපයනු ලබන අරමුදල් මහ බැංකුව හරහා යොමු කර ව්‍යාපෘතියේ අරමුණු සඳහා යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිහිපයක් සිදු කිරීම සඳහා UNDP මගින් වැය කර තිබුණි. ඒ අනුව ඇ. ඩො. මිලියන 8.08 ක කට සමාන රු. මිලියන 2,408.9ක් UNDP විසින් රඳවා ගෙන තිබුණි.එ අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ සම්පූර්ණ විසර්ජනයෙන් සියයට 26 ක් නියෝජනය කරන විධායක ආයතනය වූ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය (MMDE) වෙත ලබා දී ඇති මුදල සඳහා පමණක් වන බැවින්, මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ සමස්ත ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය මූල්‍ය ප්‍රකාශන මගින් පිළිබිඹු වී නොතිබුණි. ඒ අනුව විගණන කටයුතු MMDE විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් වලට සීමා විය. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා ශේෂ පිරික්සුමේ සමුච්චිත අරමුදල් ලෙස රු. මිලියන 53 ක හඳුනා නොගත් ණය ශේෂයක් පෙන්වා තිබුණද, එවැනි ශේෂයක් මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. සාකච්ඡාවේදී විගණන නිරීක්ෂණ පිළිගනු ලැබීය. | මූල්‍ය ප්‍රකාශනවල සියලුම ගනුදෙනු හෙළිදරව් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | රු. මිලියන 144.47 ට සමාන ඇ. ඩො. 397,873.84 ක් වන ලැබුණු බැදීම් ගාස්තු සහ හිඟ අත්තිකාරම් සම්බන්ධ වගකීම් UNDP විසින් සපයන ලද ඒකාබද්ධ බෙදාහැරීමේ වාර්තාවට ඇතුළත් කර තිබුණි. කෙසේ වෙතත්, එම ගාස්තු සහ හිඟ අත්තිකාරම් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. සාකච්ඡාවේදී විගණන නිරීක්ෂණ පිළිගනු ලැබීය. | මූල්‍ය ප්‍රකාශනවල සම්පූර්ණ වගකීම් හෙළි කිරීමට ක්‍රියා කළ යුතුය. |

## 2.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| අංකය | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම/විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති ලේඛනයේ 7 වන කොටසෙහි 69 වන වගන්තිය | ඒකාබද්ධ බෙදාහැරීමේ වාර්තාව (CDR) වාරිමාර්ග අමාත්‍යාංශයේ (ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ) ලේකම් විසින් අනුමත කළ යුතුය. කෙසේ වුවද, 2017 සිට 2022 දක්වා කාලය තුළ ඒකාබද්ධ බෙදාහැරීමේ වාර්තාව අනුමත කිරීමේදී ලේකම්වරයා විසින් සහතික කර තිබුණේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අදාළ ඇමෙරිකානු ඩොලර් මිලියන 12.5 ක වියදම පමණි. | නිරීක්ෂණ පිළිගනු ලැබේ | ඒකාබද්ධ බෙදාහැරීමේ වාර්තාව කිසිදු කොන්දේසියකින් තොරව වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කළ යුතුය. |
| (ආ) | FAA හි අරමුදල් යෝජනාවේ B කොටස | 2022 වසරෙන් අවසන් වන තෙක් රු. මිලියන 1,465.15 (ඇමරිකානු ඩොලර් මිලියන 7.99) හරිත දේශගුණික අරමුදලෙන් සහ ශ්‍රී ලංකා රජයෙන් රු. මිලියන 1,489.95 (ඇමරිකානු ඩොලර් | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමග අත්සන් කරන ලද ගිවිසුම් ලිපියක් හේතුවෙන් මෙම ව්‍යාපෘතිය මතබේදාත්මක | කොන්දේසිය අනුව ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය වෙත ලැබෙන මුදල පදනම් කරගෙන රජයේ දායකත්වය නිදහස් |

| | | | | |
|---|---|---|---|---|
| | | මිලියන 6.81) ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ලැබී තිබුණි.<br><br>FAA හි අරමුදල් යෝජනාවේ B කොටසට අනුව, ශ්‍රී ලංකා රජයේ දායකත්වය 27% ක් වන අතර GCF හි දායකත්වය ව්‍යාපෘතියේ මුළු අයවැයෙන් 73% කි. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය විසින් දැරීමට නියමිත වියදම රු. මිලියන 461.62, ක් වුවත් 2017 සිට 2022 දක්වා රු. මිලියන 1,423.95 ක් වැය කර තිබූ බැවින් ශ්‍රී ලංකා රජය රු. මිලියන 962.33 අතිරේකව ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණි. | තත්වයකට පත් වී තිබුණි. ක්‍රියාත්මක කිරීමේ කටයුතු සඳහා ගෝලීය ප්‍රජා අරමුදලෙන් (GCF) අරමුදල් රඳවා ගැනීමට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) අවශ්‍ය වන වගන්තියක් ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි. මෙය අංක 3 වගන්තියෙන් විචලනය වීමට හේතු වී තිබූ අතර, GCF හි ආදායම සඳහා භාණ්ඩාගාරය විසින් සම-මුල්‍යකරණ අරමුදල් පමණක් නිකුත් කර තිබුණි. මුදල් අමාත්‍යාංශය විසින් වියදම් නිවැරදිව වාර්තා කිරීම සහ සම මුල්‍යකරණ විධිවිධාන වලට අවශ්‍ය චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. ඒ අනුව, UNDP විසින් 2017 සිට 2021 දක්වා ආවරණය වන පරිදි ඔවුන්ගේ ක්‍රියාත්මක වියදම් ප්‍රකාශය 2023 ජූලි 20 වන දින වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත 2023 අගෝස්තු 4 වන දින සහ ලේකම්වරයාගේ සහතිකය සමඟ භාණ්ඩාගාරයට ඉදිරිපත් කරන ලදී. | කළ යුතුය. |
| (ඇ) | FAA හි 2.01 වගන්තිය | මෙම වගන්තිය අනුව ප්‍රතිතනය ලත් ආයතනය (UNDP), "විධායක ආයතනය විසින් අරමුදල් සපයන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම මෙහෙයවීම සහ අධීක්ෂණය කළ යුතුය", නමුත් ප්‍රතිතනය ලත් ආයතනය (UNDP) ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ නිරත වී තිබූ අතර මුළු | පිළිතුරු ඉදිරිපත් කර නැත. සාකච්ඡාවේදී විගණන නිරීක්ෂණ පිළිගනු ලැබීය. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් ක්‍රියාත්මක කළ යුතු අතර FAA ප්‍රකාරව ප්‍රතිතනය ලත් නියෝජිතායතනය |

| | | | |
|---|---|---|---|
| | වියදමෙන් සියයට 62.78 ක් නොහොත් ඇ. ඩොලර් මිලියන 13.94 ට සමාන රු. මිලියන 2,776.61 ක් 2017-2022 කාලය තුළ වියදම් කර තිබුණි. | | විසින් මෙහෙයවීම සහ අධීක්ෂණය කළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාදනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අසහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වසරේ සිට 2022 වසර අවසානය දක්වා වැව් 244 ක් ප්‍රතිසංස්කරණය කිරීමට කොන්ත්‍රාත්තු 116 ක් සඳහා රු. මිලියන 2,408.6 ක් ප්‍රදානය කර තිබුණි. ඒ අතරින් කොන්ත්‍රාත් පැකේජ 30 කට අදාල වටිනාකම රු. මිලියන 617.6 ක් වන වැව් 53 ක ඉදිකිරීම් වලින් 50% ක් නිම කිරීමෙන් පසු වසර 3ක කාලයක් අක්‍රියව පැවතුණි . | පිළිතුරු ඉදිරිපත් කර නැත. සාකච්ඡාවේදී විගණන නිරීක්ෂණ පිළිගනු ලැබීය. | ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නියමිත කාල සීමාව තුළ සියලුම ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘති ලේඛනයේ IX (111) සහ X වගන්තියට අනුව, 2022 දෙසැම්බර් 31 දක්වා GOSL සංරචකයෙන් අපේක්ෂිත දායකත්වය ඇමෙරිකානු ඩොලර් මිලියන 12.6 ක් විය. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 අවසානය දක්වා ශ්‍රී ලංකා රජයේ (GOSL) දායකය සියයට 54.09 ට සමාන ඇමෙරිකානු ඩොලර් මිලියන 6.8 ක් පමණක් වී ඇති බව නිරීක්ෂණය වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත. සාකච්ඡාවේදී විගණන නිරීක්ෂණ පිළිගනු ලැබීය. | වත්මන් තත්ත්වය අනුව ප්‍රදාන කරුගේ එකඟතාවය ඇතිව ව්‍යාපෘති ලේඛනය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මතභේදාත්මක ස්වභාවයේ ගණුදෙනු

පසුගිය විගණන වාර්තාවේ පෙන්වා දුන් නොවිසඳී තිබුණු කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අසහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| කැපකිරීම් ගාස්තු සහ සිදු කරන ලද සහතික නොකළ වැඩ සම්බන්ධ වගකීම් ඇ.ඩො. මිලියන 2.3 කට සමාන රු. මිලියන 458.09 ක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) විසින් සපයන ලද ඒකාබද්ධ බෙදාහැරීමේ වාර්තාවට ඇතුළත් කර තිබුණි. කෙසේ වෙතත්, එම කැපවීම් ගාස්තු සහ සහතික නොකළ කාර්යයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනයේ අනාවරණය කර නොතිබුණි. | මෙම නිරීක්ෂණය පිළිගනු ලැබේ. නියමිත කාලය තුළ ඔබේ පරීක්ෂාව සඳහා මූල්‍ය ප්‍රකාශන සමඟ සවිස්තරාත්මක වාර්තාවක් කාරුණිකව ඉදිරිපත් කරනු ලැබේ. | 2021 වසර සඳහා විගණකගේ නිර්දේශය සඳහා නිවැරදි පියවර ගත යුතුය. |